මහසෙක්‍රතාරිස් වෙනුව.

---

**No. 4,533, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 8වෙනි දිනවූ බදාදා දවල් 12ට කහවත්තේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 263. ගම—පල්ලත්තර.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 110 | දෙහිගහහේන, කුඹුගේහේන | (1) පටබැඳිපතිරනගේ ජුවානිස්, (2) එම එලියස්, (3) මුනසින්ආරච්චිගේ හාමි, (4) එම ඕදිරිස්හාමි, (5) පුංචිහේවාගේ බබියනේ, (6) වීරසින්ආරච්චිගේ දනෝහාමි | පැහිරි සහ හේන | 37 2 0 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 12වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහසෙක්‍රතාරිස් වෙනුව.

---

**No. 4,534, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 2වෙනි දිනවූ බ්‍රහස්පතින් දවල් 12ට කහවත්තේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 312.—සිරිනමළුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 205*b* | මහවත්ත | කහඳුවගේ ගම්ආරච්චිගේ ජුවානිස් | වත්ත | 1 2 15 |
| 205*c* | එම | එම | එම | 0 3 20 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහසෙක්‍රතාරිස් වෙනුව.

---

**No. 4,535, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 9වෙනි දිනවූ බ්‍රහස්පතින්දා දවල් 12ට කහවත්තේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ සිතියම 308. ගම—පූවක්දන්ඩාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම | මහත, අ. රූ. ප |
|---|---|---|---|---|
| 177 | ගමගේගොඩැල්ල | වීරසින්ගේ දොන් දවිත් | පැහිරි | 1 1 7 |
| 177*a* | එම | ඩබ්ලිව්. දොන් දවිත් | එම | 1 1 21 |
| 177*b* | එම | එම | එම | 1 3 28 |
| 177*d* | මාකාවිටගේවත්ත නොහොත් වීරසින්ගේගොඩැල්ලවත්ත | ජයසිංහආරච්චිගේ දොන් කෝර්නේලිස් | වත්ත | 4 0 0 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහසෙක්‍රතාරිස් වෙනුව.

**No. 4,536, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන් ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 1වෙනි දිනවූ බදාදා දවල් 12ට කහවත්තේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 263. ගම—පල්ලත්තර.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 422 | මැදපිට්ටනියේවැව .. | .. ආණ්ඩුව .. | .. වැව | .. 0 2 35 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට 50 දක්වාය.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,537, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 1වෙනි දිනවූ බදාදා දවල් 12ට කහවත්තේ වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 274. ගම—උඩුගල්මොරේ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 6 | මොරකැටිය | .. ආණ්ඩුව, (1) උඩුගල්මොරේ පදිංචි දොන් නිකුලස් වීරසිංහ, (2) යටිගල පදිංචි දොන් දියෝනිස් ලියනපතිරන හිටපු පිස්කල් ඔපිසර් විසින් කිසි මුදල් ගෙවා නැත .. | .. හේන | .. 7 0 21 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,538, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 1වෙනි දිනවූ බදාදා දවල් 12ට කහවත්තේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 317. ගම—පලතුඩුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 44 | තුඩුවේගොඩකැල්ල .. | දොන් බස්තියන් ජයසූරිය වෙනුවට නංගල්ලේ පදිංචි අනුසස් ද සිල්වා මහතමිර .. .. | .. පිට්ටනිය | .. 1 0 23 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,539, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ මැයි මස 8වෙනි දිනවූ බදාදා දවල් 12ට කහවත්තේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ බස්නාහිර ගිරුවාපත්තු කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 9ක්.

ලංකාමැනීමේ සිතියම 240. ගම—තම්බුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 18g | අලියාමලවැව | .. ආණ්ඩුව, ලියනපතිරනගේ දිංගතස්සාමිගේ වගාව .. | .. වත්ත | .. 0 2 9 |
| 27b | එම | .. එම .. .. | .. එම | .. 0 1 32 |
| 18f | ගල්මුල්ලේහේන | .. ආණ්ඩුව, ලියනපතිරනගේ දවිත්ගේ වගාව .. | .. එම | .. 0 2 22 |
| 18h | ඉදිකැටියේහේන | .. ආණ්ඩුව, රයිගමගේ බත්තුහාමි විසින් ඉල්ලම්කර තිබේ | .. එම | .. 1 2 22 |
| 18i | එම | .. එම .. .. | .. හේන | .. 0 0 23 |
| 18j | එම | .. එම .. .. | .. එම | .. 0 0 25 |
| 27a | අලියාමලහේන | .. ආණ්ඩුව, ජතුන්ගේ බබාඅප්පු විසින් ඉල්ලම්කර තිබේ.. | .. වත්ත | .. 0 3 38 |
| 40b | කහත්තේගොඩවත්ත | .. රාජපක්ෂපතිරනගේ දොන් අන්ද්‍රිස් .. .. | .. එම | .. 0 0 22 |
| 134 | ගිනිපල්ලේවත්තකොටස් අයොන්අරයේවත්ත | තටපුලියේ බබේව් .. .. | .. එම | .. 0 0 25 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට 50 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කරුණ ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—සීර කඩ සෑදීමටද, පහත් බිම්කට්ටි දෙකක කානු සෑදීමට සහ අලුත් පාරවල්වලට සහ හිස්ව නැබිය යුතු ස්ථාන වල් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංචාර්තුවල ප්‍රකාරයට කාරකමනත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියම 16,655. ගම—වැලිහම්පිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කෝන්ගහවත්ත නො හෝත් හික්ගහවත්ත | ගල්බිත්ති තිබෙන ගෙයක් සහ පොල්අතු මඩුවක්ද තිබේ .. .. | .. ජේ. ඩී. වී. සමරනායක | .. 0 0 0·28 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | කෝන්ගහවත්ත නොහොත් හික්ගහවතත | පොල්ගස්ද, උළු ගෙවල් දෙකක්ද, පොල්අතු සෙවිල්ලපු ගඩොල් බිත්ති ඇති ගෙයක්ද, මඩුවක් සහ ළිදක්ද තිබේ .. .. | ජේ. ඒ. ඩී. වී. සමරනායක සහ වෙන අයවළුන් | .. 0 0 36·14 |
| 3 | එම | .. ගල් බිත්ති ඇති පොල්අතු කඩයක් තිබේ .. | එම | .. 0 0 22·62 |
| 4 | කහටගහවත්ත | .. පොල් සහ පුවක්ගස් තිබේ .. | .. ඇස්. ඇන්. ෆොන්සේකා | .. 0 0 2·37 |
| 5 | එම | .. පොල්ගස් සහ හරක්මඩුවක්ද තිබේ | .. ඇල්. එච්. ප්‍රනාන්දු සහ වෙන අයවළුන් | .. 0 0 5·64 |
| 6 | එම | .. පොල්ගස් තිබේ .. | .. පී. ඇන්. ප්‍රනාන්දු | .. 0 0 5·84 |
| 7 | එම | .. එම .. .. | .. ඇල්. ඒ. ප්‍රනාන්දු | .. 0 0 4·34 |
| 8 | එම | .. පොල් සහ වෙන ගස් ජාති සහ පොල්අතු ගෙයක්ද තිබේ .. .. .. | ඊ. ජී. ප්‍රනාන්දු සහ වෙන අයවළුන් | .. 0 0 11·56 |
| 9 | මිල්ලගහවත්ත | .. පොල් සහ වෙන ගස් ජාතිද, උළු ගෙයක්ද තිබේ .. | ඊ. ජී. ප්‍රනාන්දු | .. 0 0 2·22 |
| 10 | එම | .. පොල් සහ ගල් බිත්ති ඇති ගෙයක් සහ මඩුවක්ද තිබේ .. .. .. | එච්. එදිරිසිංහ දෙස්කර මහත්මයා | .. 0 0 3·57 |
| 11 | එම | .. පොල්ගස් තිබේ .. | .. ජේ. පී. රණසිංහ | .. 0 2 19·76 |
| 12 | එම | .. පොල් සහ වෙන ගස් ජාති තිබේ | .. ඇස්. ජේ. ද ෆොන්සේකා | .. 0 1 35·77 |
| 13 | එම | .. පොල්ගස් තිබේ .. | .. ඇල්. එච්. ප්‍රනාන්දු | .. 0 0 0·14 |
| 14 | දඹුගහවත්ත | .. පොල් සහ වෙන ගස්ද, උළු ගෙයක්ද, මඩු තුනක්ද, ළිදක්ද, මඩුවක්ද, පොල්අතු සෙවිලි මඩුවක කොටසක්ද තිබේ .. .. | සී. ඇම්. රෙෝවෙල් සහ වෙන අයවළුන් | .. 1 0 0·21 |
| 15 | එම | .. පොල්ගස්ද, උළුගේක කොටසක්ද, ඉස්තොප්පුවක්ද තිබේ .. .. | ආණ්ඩුව | .. 0 0 1·87 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 19වෙනි දින දවල් 12ගේ කනිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 11වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පාඨශාලාවක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 16,659. ගම—දෙල්තර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තලකනත්ත | .. එලිකරපු කැලෑව | .. ඒ. පී. ගුණවර්ධන .. | .. 0 0 36·4 |
| 2 | එම | .. කැලෑව | .. අන්දරදිගේ බස්තියන් සිල්වා .. | .. 0 0 21·4 |
| 3 | එම | .. එම | .. අන්දරදිගේ මවුනිස් සිල්වා සහ වෙන අය | .. 0 0 20·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 18වෙනි දින දවල් 12ගේ කනිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 2වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මිශ්‍ර පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 6,832. ගම—තිස්පනේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කිවල්ගොඩගෙදරවත්ත නොහොත් හමිල්ලගෙදරවත්ත | .. වත්ත | .. ටී. ඇම්. මුදලිහාමි නොහොත් ඇන්. පුංචිරාල | .. 0 0 33·34 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 20වෙනි දින පෙරවරු 10යේ කනිසමට නුවරඑළියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 7වෙනි
දින නුවරඑළියේ කච්චේරියේදීය.

ඇම්. ඇම්. වැඩර්බර්න්,
ආණ්ඩුවේ උපඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගල්වළක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 6,828. ගම—මතුරට.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හයිපොරස්ව්වත්ත .. | ගේ සහ ගල .. | හයිපොරස්ව් ටී ඇස්ටේට් කොම්පැනිය .. | 0 0 7·7 |
| 2 | එම .. | එම .. | එම .. .. | 0 0 4·4 |
| 3 | එම .. | තණකොල .. | එම .. .. | 0 0 5 |
| 4 | එම .. | ගේ .. | එම .. .. | 0 0 5 |
| 5 | එම .. | එම .. | එම .. .. | 0 0 0·8 |
| 6 | එම .. | ගේ සහ ගල .. | එම .. .. | 0 0 9·3 |
| 7 | එම .. | පාර .. | එම .. .. | 0 0 3·9 |
| 8 | එම .. | ගම්පැල .. | එම .. .. | 0 0 17·3 |
| 9 | එම .. | එම .. | එම .. .. | 0 0 22·8 |
| 10 | එම .. | එම .. | එම .. .. | 0 0 2·8 |
| 11 | එම .. | අඩිපාර .. | එම .. .. | 0 0 2·3 |
| 12 | එම .. | එම .. | එම .. .. | 0 0 5·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමූන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ අප්‍රේල් මස 20වෙනි දින 10යේ කනිසමට නුවරඑළියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දූනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ මාර්තු මස 7වෙනි දින
නුවරඑළියේ කච්චේරියේදීය.

ඇම්. ඇම්. වැඩර්බර්න්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දූන්වීම්.

[කළුතර දූන්වීම් නො. 6,788.]

වර්ෂ 1918ක්වූ මාර්තු මස 15වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් එම අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දූනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කේ බස්නාහිර පස්දුන්කෝරළේ වලල්ලාවිටිපත්තුවේ ගම්මන යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—මුල් සිතියම 87.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1H2 .. | නැදුන්ගහවෙලලග කට්ටිය .. .. .. .. | 0 3 20 |

මීට මායිම්—උතුරට දියපාරක්ද; නැගෙණහිරට නැදුන්ගහවෙලපහලකට්ටියද, (328,525 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම); දකුණට සහ බස්නාහිරට බෙන්තොට ගඟද, (දකුණු දිසාවේ ඉම.)

II.—මුල් සිතියම 87.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 59 .. | හික්ගහදූව .. .. .. .. .. | 0 3 0 |

මීට මායිම්—උතුරට හික්ගහදූවද, 189,231 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද; නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට තැන්නගේ ජේම්ස් විසින් අයිතිකම්කියන නැදුන්ගහවෙලද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 426වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කළුතර වී. ම. 5—1918.]

[කුරුණෑගල දූන්වීම නො. 6,789.]

වර්ෂ 1918ක්වූ මාර්තු මස 15වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිටහෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්නට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දූනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

## ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙණිහත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරලේ ජීල්ගල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

### I.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 9 | නුගවෙලගාවාහේන | 4 1 0 |
| 9C | ගල්කන්ද | 2 1 28 |
| | | 6 2 28 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණාපු කැටකන්දගාවාවත්තද (324,801 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), රජසන්තක කැටකන්දද; නැගෙණහිරට රජසන්තක දිවුල්ගහපිටියවත්තද, ආණ්ඩුව විසින් විකුණාපු නුගවෙලගාවාහේන සහ දිවුල්පිටියහේනද (326,648 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), කරුනාදිපතිමුදියන්සෙලාගේ අවුසදහාමි ආරච්චි විසින් අයිතිකම්කියන ඇලගාවාවත්ත සහ දිවුල්ගහපිටියවත්තද; දකුණට කරුණාධිපති මුදියන්සෙලාගේ අවුසදහාමි ආරච්චි විසින් අයිතිකම්කියන ඇලගාවාවත්ත සහ දිවුල්ගහපිටියවත්තද, ඇස්. ඒ. ගුනරත්න සහ තවත් අය විසින් අයිතිකම්කියන මකුල්ල ගහමුලකුඹුරද. ගල්පැලිනේඇලද; බස්නාහිරට ගල්පැලිනේඇලද, රජසන්තක ගල්කන්දගාවාවත්තද, රජසන්තක ගල් කන්දගාවාහේනද.

### II.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 20T | කිරියාවෙදගේහේන | 1 2 9 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විකුණාපු ඉන්නවත්ත නොහොත් මෙනේරිවත්තේහේනද (326,682 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ඇස්. ඒ. ඇන්ඩිරල සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන නුගවෙලගාවාවත්තද; නැගෙණහිරට ඇස්. ඒ. ඇන්ඩිරල සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන නුගවෙලගාවාවත්තද; දකුණට පාරක්ද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණාපු කෝන්ගහමුලවත්තද.

### III.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 21K | බුළුගහමුලහේන | 2 0 24 |

මීට මායිම්—උතුරට රජසන්තක බුළුගහමුලහේනද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණාපු බුළුගහමුල්ලහේනේ වත්තද; දකුණට රජසන්තක අගනවෙලේහේනද; බස්නාහිරට රජසන්තක කටුපිල්ලගොල්ලේහේනද, රජසන්තක බරන් දරමූකලානද.

### IV.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 21S | කන්දබොඩහේනවත්ත | 5 2 9 |
| 32 | කන්දබොඩකුඹුරේපිල්ලෑව | 1 1 25 |
| 32A | ඉහලවෙලපිල්ලෑව | 1 0 8 |
| | | 8 0 2 |

මීට මායිම්—උතුරට රජසන්තක බටගොල්ලකන්දද; නැගෙණහිරට ප්‍රවේනි බටගොල්ලකන්දද, 226,004 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද, ප්‍රවේනි බටගොල්ලකන්දද, රජසන්තක බටගොල්ලකන්දද, රජසන්තක ගොන්නගහමුලහේනද; දකුණට විජේසිංහ හේරත්මුදියන්සේලාගේ කපුරුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කජුගහමුල්ලවත්තද, ඇස්. ඒ. මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දවටගහකුඹුරද, ඇලක්ද; බස්නාහිරට ඇස්. ඒ. මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දවටගහකුඹුරද, ආණ්ඩුව විසින් විකුණාපු කොලොන්ගහහේනද.

### V.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 21AE | බෝගහමුලහේන | 2 2 0 |

මීට මායිම්—උතුරට රජසන්තක කොලොන්ගහමුලහේනෙවත්ත සහ බඩාලාකොටාපුහේනේවත්තද, ඩබ්ලිව්. එච්. ඇම්. පුන්චිමැනිකා සහ තවත් අය විසින් අයිතිකම්කියන බෝගහමුලවත්තද; නැගෙණහිරට රජසන්තක මතම්බලාගහ මූලවත්ත සහ කොලොන්ගහමුලවත්තද; දකුණට රජසන්තක මිහිමරුගොඩැල්ලද; බස්නාහිරට මිහිමරුගොඩැල්ලද, ආණ්ඩුව විසින් විකුණාපු කිළුම්පැලයාඹිටහේනද (327,140 පිඹුරුකඩදාසියේ පේන ඉඩම).

### VI.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 31 | ඉහලවෙලේපිල්ලෑව | 0 2 4 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණාපු කොලොන්ගහහේනද, ඇස්. ඒ. මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම් කියන දවටගහකුඹුරද; නැගෙණහිරට සහ දකුණට ඇස්. ඒ. මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දවටගහ කුඹුරද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණාපු බුළුගහමුලහේනවත්තද, ආණ්ඩුව විසින් විකුණාපු පන්වැවේපිල්ලෑවද, ඇලක්ද.

### VII.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 34 | කොලොන්ගහමුලවත්ත නොහොත් වාඩියේවත්තේහේන | 1 0 10 |

මීට මායිම්—උතුරට රජසන්තක ගොන්නගහමුලහේනද; නැගෙණහිරට මලලඅප්පුහාමිලාගේ පොඩිහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කදුරුගහමුලවත්තද, අබේසින්හමුදියන්සෙලාගේ රන්මැනිකා විසින් අයිතිකම්කියන කෝන්ගහමුලවත්තද; දකුණට ඇලක්ද; බස්නාහිරට ඒ. ඇම්. රන්මැනිකා විසින් අයිතිකම්කියන කෝන්ගහමුලවාඩියේ වත්තද, විජේසිංහහේරත්මුදියන්සෙලාගේ කපුරුහාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන කජුගහමුලවත්තද.

### VIII.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 39I | කමතගාවාහේනවත්ත | 1 3 20 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණාපු කමතගාවාහේනද (328,131 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), කරුණාදිපතිමුදියන්සේලාගේ උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන කමතගාවාවත්තද, ඇස්. ඒ. මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දවටගහකුඹුරද; නැගෙණහිරට ඇස්. ඒ. මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දවටගහ කුඹුරද; දකුණට කේ. ඇම්. උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන කමතද, ඇස්. ඒ. මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන දවටගහකුඹුරද; රජසන්තක අස්වැද්දුමේ පිල්ලෑවේහේනද; බස්නාහිරට කරුණාදිපතිමුදියන්සේලාගේ උක්කුබන්ඩා විදනේ විසින් අයිතිකම්කියන අස්වැද්දුමේබැම්මද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 427—429වෙනි පිටුවල සැලැන් බලනු.

IX.—මුල් සිතියම 558.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 54A .. | අච්චේරිවත්තේහේනා .. ... .. .. | 2 1 1 |

මීට මායිම්—උතුරට රජසන්තක හෙවහේවත්ත සහ දෙල්ගහමුලවත්තද, (ප්‍රාවෙනි) වල්පල්ගලේහේනද; නැගෙණහිරට රජසන්තක වල්පොලගලමූකලානද; දකුණට රජසන්තක තුගවෙලගාවාහේනද; බස්නාහිරට කේ. ඇම්. පුංචිමැනිකා සහ තවත් අය විසින් අයිතිකම්කියන කලහාගහපිටිගේවත්තද, ආණ්ඩුව විසින් විකුණපු මහකුඹුරේපිල්ලෑවද (327,131 පිඹුරුකඩදාසියේ පේන ඉඩම), පිටඇලද.

[කුරුනෑගල වි. ම. 21—1918.]

---

[මාතලේ දූත්වීම නො. 6,790.]

වෂී 1897 හේ, 1899 යේ සහ 1900, 1903 හේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දූනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වෂී 1918ක්වූ මාර්තු 15වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මධ්‍යම දිසාවේ මාතලේ කච්චේරියට ඇවිත් උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩමට නොහොත් වැඩි ගණනකට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කටින් හෝ ලියමනකින් කියා නොසිටියොත් එකී මාතලේ උප ඒජන්ත උන්නාන්සේ විසින් එකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබීතිබෙන බලපුළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම නොහොත් ඉඩම් රජසන්තක ඉඩමක් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දූනගත යුතුයි.

ජී. ඊ. මිලින්ටන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

කියන්නේ මේ ඉඩම ගැනයි.

මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කේ මාතලේ නැගෙණහිර පලාතේ ලග්ගල උඩසියපත්තුවේ මැදඇල යන ගමේ පිහිටා තිබෙන ගලපල්ලේරෙද (උල්පතට ඉතුරුකර තිබෙන හරිය) සහ ගලපල්ලේහේන (උල්පතට ඉතුරුකර තිබෙන හරිය) කියා ව්‍යවහාරකරණ රූඩ් 1කුත් පර්චස් 31ක් විශාල ඇති නොම්මර 6,411යේ මුල් සිතියමේ පේන නොම්මර 1,548 සහ 1,549යේ මිට යාකර තිබෙන සිතියමේ* පේන ඉඩම්ය. ඊට මායිම්:—උතුරට නොම්මර 308,144 දරණ පිඹුරුකඩදාසියේ පේන ඉඩමද; නැගෙණහිරට රත්නායක අයිතිවාසිකම්කියන ගලපල්ලේකුඹුරේපිල්ලෑවද; දකුණට හන්කිරිමඩිත්ත සහ හන්කිරිමඩිත්තේ රෙද කියන ආණ්ඩුව සන්තක ඉඩමද; බස්නාහිරට ඕංගිරිබන්ඩා අයිතිවාසිකම්කියන උඩහේනද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 430වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

## ඉඩම් ආණ්ඩුවට ගැනීමේ දූන්වීම.

නැගෙණහිර දිසාවේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කේ තම්බලගම් පත්තුවේ චේනන්වඩි යන ගමේ පිහිටා තිබෙන්නාවූද, අක්කර තුණකුත් රූඩ් එකකුත් පර්චස් දෙකක් වපසරිය ඇතිවූද මීට අමුනා තිබෙන හැඩුල් පත්‍රයේ විස්තර සටහන්වූද ඉඩම් කැබැල්ල ආණ්ඩුව විසින් සහ ආණ්ඩුව වෙනුවෙන් ලියාදෙන ලද්දේවිනමුත් එය දූනට අවුරුදු අටකට වැඩි කාලයක් මුළුල්ලේ අයිතිකාරයන් විසින් අත්හැරදමා තිබෙන බව පෙණෙන නිසා මා විසින් කඩිසරවූද සෑහෙන්නාවූද සියලුම වගවිභාගකරණලැබූ නමුත් එබඳු අයිතිකාරයන්වත් නීති ප්‍රකාර අයිතිකමක් කියාසිටින කෙනෙක්වත් සොයාගන්ට බැරිබැවින් නැගෙණහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්තධූරන්ධර රිචර්ඩ් ආර්තර් ග්‍රිණ්ඩෝල් ෆේපස්ට් යන මා වෂී 1887 තේ අංක 4 දරණ ආඥාපණතෙන් මට ලැබී තිබෙන බලපුළුවන්කම් කරණකොටගෙණද ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ සම්මතය ඇතුවද මෙයින් ප්‍රකාශකරණ වගනම්—එකී ඉඩමට තම අයිතිකම ඔප්පුකළහැකි කෙනෙක් විසින් හෝ එබඳු අයෙක් වෙනුවෙන් කෙනෙක් විසින් හෝ වෂී 1919යේ අප්‍රේල් මස 19වෙනි දින හෝ ඊට මත්තෙන් අයිතිකම මට කියා නොසිටියොත් එම ඉඩම එකී ආඥාපණතේ 2වෙනි වගන්තියේ ප්‍රකාර ආණ්ඩුව විසින් ආපසු ගන්නාබව ඊට වැදගන්නා සියල්ලෝම දූනගනිත්වා.

මා විසින් අත්සන්කොට මඩකලපුවේ කච්චේරියේදී දෙන්ට යෙදුනේ වෂී 1918ක්වූ පෙබරවාරි මස නමවෙනි දිනදීය.

ආර්. ඒ. ජී. පැස්ට්,
නැ. දි. ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

එකී හැඩුල් පත්‍රය.

ත්‍රිකුණාමලේ තම්බලගම් පත්තුවේ චේනන්වඩියේ පිහිටා තිබෙන අංක 711හේ මුල් සිතියමේ (ටයිටල් ප්ලෑන 103,574) අංක 8821 ලකුණුකර තිබෙන ඉඩම්කැබැල්ල.

මායිම—බස්නාහිරට ආණ්ඩුවට අයිතියකියන ඉඩම අනිත් සියලුම පැතිවලට "තෝනා" නම් දියවළ.

වපසරිය—අක්කර 3යි රූඩ් 1යි පර්චස් 2යි.

මෙම ඉඩම 1876යේදී කාදර් මියදින් සින්නතම්බිට ආණ්ඩුවේ ඔප්පුවක් පිට ලියාදෙනලදී.

---

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.